# අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරඟය - 2019

## අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් ශාඛාව

## දිස්ත්‍රික් තරග වටය

## ශාසනික චරියා කුසලතා - ප්‍රායෝගික අංශය

01. සෙත් පිරිත් දේශනයකදී අනුගමනය කරන චාරිත්‍ර විධි පියවර 3කින් සඳහන් කරන්න.

I. සෙත් පිරිතට ආරාධනාව භාර ගන්නා අවස්ථාවේදී අවශ්‍ය වන දෑ පිළිබඳ දැනුවත් කිරීම.

II. සෙත් පිරිත් දේශනා කිරීමට ප්‍රථම ස්ථානය, පූජාසන ආදී සකස් කර ගැනීම.

III. දායකයා විසින් දැහැත් වට්ටිය පිළිගන්වා පිරිතට ආරාධනා කිරීම.

IV. පන්සිල් සමාදන් කර අනුශාසනාවෙන් පසු දේවතාරාධනාවක් පවත්වා පිරිත ආරම්භ කිරීම.

V. සෙත් පිරිත් සජ්ඣායනාවෙන් පසු පිරිත් පැන් පිරිත් නූල් ලබා දී කටයුතු අවසන් කිරීම.

02. සාංඝික දානමය පිං කමක් සිදු කරන ආකාරය පියවර 5කින් පැහැදිලි කරන්න.

i. දානයට ආරාධනා කරන විට ඒ පිළිබඳ දායකයා දැනුවත් කිරීම.

ii. කරඬුව පෙරටු කරගෙන පෙරවරු 11ට දාන ශාලාව වැඩම කිරීම.

iii. අසුන් ගැනීමේදී ධාතුකරඬුව දකුණු පසින් සිටින සේ සහ මහළු පිළිවෙලට වැඩ සිටීම.

iv. පන්සිල් සමාදන් කරවා බුද්ධ පූජාව පැවැත්වීම.

v. අවශ්‍ය අනුශාසනා ලබා දී දානය සාංඝික කර වළඳා අවසානයේ දී භුක්තානුමෝදනාවෙන් පසුව සෙත් පතා ධාතුකරඬුව පෙරටු කරගෙන වැඩම කිරීම.

03. බෝධි පූජාවක් පැවැත්වීමේදී අනුගමනය කළයුතු පියවර 5ක් නම් කරන්න.

I. ආරාධනාව භාර ගැනීමේදී දායකයන් දැනුවත් කිරීම.

II. බෝධීන් වහන්සේ වටා ආසන මත පූජාව තැන්පත් කිරීම.

III. පැන් කළයකින් බෝධිය නැවීම.

IV. දැහැත් වට්ටිය භාරගෙන පන්සිල් සමාදන් කර බෝධි පූජාව පැවැත්වීම.

V. සෙත් පිරිත් සජ්ඣායනා කර පුණ්‍යානුමෝදනා කිරීම.

04. මතක වස්ත්‍ර පූජාවක් සිදු කරන අයුරු කරුණු අවස්ථා පහකින් පැහැදිලි කරන්න.

I. භික්ෂූන් වහන්සේලා වැඩම කරවීම.

II. දැහැත් වට්ටිය පිළිගන්වා ආරාධනා කිරීම.

III. පන්සිල් සමාදන් කරවා භික්ෂූන් වහන්සේලා පිළිගැනීම.

IV. මතක වස්ත්‍රය සාංඝික කර අනිත්‍ය ප්‍රතිසංයුක්ත ගාථා සජ්ඣායනා කිරීම.

V. කෙටි අනුශාසනාවක් කර පැන් වඩා පිං අනුමෝදන් කිරීම.